අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
"ඉසුරුපාය", බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
"இசுருபாய", பத்தரமுல்லை, இலங்கை
"Isurupaya", Battaramulla, Sri Lanka
+94112785141-50 +9411278581
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref: ED/01/05/04/06/03-ii

ඔබේ යොමුව / உமது இல. / Your Ref:

දිනය / திகதி / Date: 2025.04.15

චක්‍රලේඛ අංක 17/2025

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පළාත් විෂය සම්බන්ධීකරණ නිලධාරීන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප විෂය සම්බන්ධීකරණ නිලධාරීන්,
සියලු ම කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම විදුහල්පතිවරුන්,
සියලු ම දෙවන ජාතික භාෂා (සිංහල/ දෙමළ) ගුරු උපදේශකවරුන්,

**<u>පාසල්, කලාප, පළාත් හා සමස්ත ලංකා මට්ටමේ දෙවන ජාතික භාෂා (සිංහල/ දෙමළ) වාර්ෂික තරගාවලිය පැවැත්වීම සඳහා වන චක්‍රලේඛය</u>**

ලේකම්ගේ අංක 2006/37(1) හා 2013.01.02 දිනැති චක්‍රලේඛය හා අංක 12/2018 හා 12/2018(ii) අංක දරණ 2018.03.13 දිනැති චක්‍රලේඛ වෙනුවට 2025.01.01 දින සිට දෙවන ජාතික භාෂා (සිංහල/ දෙමළ) තරගාවලිය සඳහා ක්‍රියාත්මක වන නව චක්‍රලේඛය මෙයින් ඉදිරිපත් කරමි. ඒ අනුව පාසල් මට්ටමේ දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) තරගාවලිය මෙම චක්‍රලේඛ විධිවිධාන සමගින් ඊට අමුණා එවා ඇති උපදෙස් සංග්‍රහය අනුව පැවැත්විය යුතු වේ.

2025 වර්ෂයේ සිට මෙම චක්‍රලේඛ උපදෙස් අනුව පළාත්, කලාප, හා පාසල් මට්ටම් නිසි පරිදි දැනුවත් කරමින් වඩාත් ප්‍රශස්ත අයුරින් වාර්ෂිකව මෙම තරගාවලිය ඒ ඒ මට්ටම්වලින් පැවැත්වීමටත්, ඉන් අනතුරුව සමස්ත ලංකා මට්ටමින් ජයග්‍රාහක සිසු සිසුවියන් තෝරා ගෙන අදාළ සහතික පත්‍ර හා පදක්කම් ප්‍රදානය කිරීමටත් කටයුතු කළ යුතු ව ඇති බව කාරුණිකව දන්වමි.

සමස්ත ලංකා මට්ටම සඳහා ජයග්‍රාහී සිසුන් ඉදිරිපත් කිරීමේ දී චක්‍රලේඛයේ සඳහන් ආකෘතිය භාවිත කරමින් අංග සම්පූර්ණව සැකසූ නිවැරදි නිල ප්‍රතිඵල අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතු බවත් ඒ අනුව සුදුසුකම් ලැබූ සිසුන් පමණක් සමස්ත ලංකා මට්ටමට නම් කිරීම පිළිබඳව ඔබගේ අවධානය යොමු කිරීම අනිවාර්ය බව ද දන්වමි.

මෙම තරගය සඳහා ඉදිරිපත් වන සියලු ම තරගකරුවන් හා අනෙකුත් පාර්ශවකරුවන් තරගයේ සෑම අවස්ථාවක දීම මෙම තරග චක්‍රලේඛයෙහි සඳහන් සියලු ම නීති රීති පිළිපැදීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය. මෙම චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට පටහැනිව කටයුතු කර ඇති බව අනාවරණය වුවහොත් සුදුසු තීරණ ගැනීම අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සතු බව ද අවධාරණය කරමි.

නාලක කළුවැව
ලේකම්

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

## 1.0. හැඳින්වීම

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාවේ දෙවන ජාතික භාෂා ඒකකය මගින් රජයේ පාසල්වල 6-9 ශ්‍රේණිවල සියලුම සිසුන් සඳහා මෙම තරගාවලිය වාර්ෂික ව පවත්වනු ලබයි.

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුකූලව සාමාන්‍ය දැනුම වර්ධනය කිරීම, නිර්මාණාත්මක කුසලතා හා දෙවන ජාතික භාෂා හැකියාව සංවර්ධනය කිරීම මෙම තරගාවලියේ අරමුණ වේ.

මෙම තරග සඳහා ඉදිරිපත් විය හැකි වන්නේ, සිංහල මාධ්‍ය පාසල්වල පළමු බස ලෙසට සිංහල ඉගෙන ගන්නා සිසුන් සඳහා දෙවන ජාතික භාෂාව දෙමළ ද, දෙමළ මාධ්‍ය පාසල්වල පළමු බස ලෙසට දෙමළ ඉගෙන ගන්නා සිසුන් සඳහා දෙවන ජාතික භාෂාව සිංහල වශයෙන් ඉගෙනුම ලබන 6 – 9 ශ්‍රේණිවල සිසුන්ටය.

1.1. මෙම තරගය තරග මට්ටම් 4කින් පැවැත්වේ.

1) පාසල් මට්ටම
2) කලාප මට්ටම
3) පළාත් මට්ටම
4) සමස්ත ලංකා මට්ටම

1.2. මව් භාෂාව සිංහල හා දෙමළ වන සිසුන්ගේ දෙවන ජාතික භාෂාව (දෙමළ හා සිංහල) සඳහා උනන්දුව වර්ධනය කිරීම සඳහා තරග ශීර්ෂ 3ක් යටතේ මෙම තරග පැවැත් වේ.

1.3. සියලුම තරග සඳහා පහත සඳහන් කොන්දේසි අදාළ වේ.

1) සිංහල මාධ්‍ය පාසල්වල මව්බස සිංහල වන සිසුන් පළමු බස ලෙස සිංහල හැදෑරීමේ දී දෙවන බස දෙමළ වන සිසුන්ටත් (සිංහල සිසුන්) දෙවන ජාතික භාෂාව දෙමළ යටතේ එක් තරග ශීර්ෂයකට පමණක් තරග කළ හැකිය.

2) සිංහල මාධ්‍ය පාසල්වල මව්බස දෙමළ වන සිසුන්, පළමු බස ලෙස සිංහල හැදෑරීමේ දී දෙවන බස දෙමළ වන සිසුන්ටත් (මුස්ලිම් හා දෙමළ සිසුන්) දෙවන ජාතික භාෂාව දෙමළ යටතේ එක් තරග ශීර්ෂයකට පමණක් තරග කළ හැකිය.

3) දෙමළ මාධ්‍ය පාසල්වල මව්බස දෙමළ වන සිසුන් පළමු බස ලෙස දෙමළ හැදෑරීමේ දී දෙවන බස සිංහල වන සිසුන්ට දෙවන ජාතික භාෂාව සිංහල යටතේ තරග කළ හැකිය.

එසේම මෙම තරගවලියේ දී ඉහත සඳහන් ශීර්ෂ 3ට අයත් සිසුන් සඳහා තරග වෙන වෙනම පවත්වා ප්‍රථම හා දෙවන ස්ථාන ලබා ගන්නා සිසුන් පමණක් (පද්‍ය ගායනා හැර) කලාප, පළාත්, හා සමස්ත ලංකා මට්ටමේ තරගවලට ඉදිරිපත් කළ යුතු වේ. පද්‍ය ගායනා තරගයේ ප්‍රථම ස්ථානය ලබා ගන්නා කණ්ඩායම පමණක් ඉදිරි තරගය සඳහා ඉදිරිපත් කළ යුතුය.

## 2.0. පොදු අරමුණු

01. ජාතීන් අතර අවබෝධතාව හා මූලික සන්නිවේදන හැකියාව වර්ධනය කිරීම.

02. ජාතික ඒකාබද්ධතාව වර්ධනය හා ජාතීන් අතර සංස්කෘතික සහජීවනය ප්‍රවර්ධනය කිරීම.

03. දෙවන ජාතික භාෂා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය විධිමත් කිරීම හා වර්ධනය කිරීම.

04. දෙවන ජාතික භාෂාවේ හා චතුර්විධ භාෂා කුසලතා ඇගයීමට ලක් කිරීම හා වර්ධනය කිරීම.

05. දෙවන ජාතික භාෂා වේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ප්‍රබෝධයක් ඇති කිරීම.

06. දෙවන ජාතික භාෂාව සම්බන්ධ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සජීවී අත්දැකීම් ලබන අවස්ථාවක් බවට පත් කිරීම.

07. වත්මන් ලෝක ගැටලු දෙස මානව දයාවෙන් යුතු ව බැලීමේ හැකියාව ඇති සංවේදී පුද්ගලයන් සමාජයට දායාද කිරීම.

## 3.0. මූලික උපදෙස්

කාල රාමුව හා තරග පැවැත්වීමේ වගකීම

| තරග මට්ටම | තරග මෙහෙයවීම හා සහභාගීත්වය | තරග පවත්වා අවසන් කළ යුතු දිනය | ප්‍රතිඵල සටහන භාර දිය යුතු අවසන් දිනය හා විස්තර |
|---|---|---|---|
| පාසල් | 1.විදුහල්පති<br>2.දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුව<br>3.පාසලේ 6-9 ශ්‍රේණිවල සිසුන් | මැයි 15 | ඒ ඒ තරගයෙන් තෝරා ගත් සිසුන් දෙදෙනා පමණක් ඇතුළත් කොට අදාළ ආකෘතිය අනුව සැකසූ නිල ප්‍රතිඵල මැයි 31 දිනට පෙර (ආකෘතිය අමුණා ඇත) තම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත යැවිය යුතුය. |
| කලාප | 1.කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ /දෙවන ජාතික භාෂා සම්බන්ධීකරණ නිලධාරී/දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුව<br>2.පාසල් තරගාවලියෙන් තෝරාගත් සිසුන් | ජූලි 30 | ඒ ඒ තරගයෙන් තෝරා ගත් සිසුන්ගේ නම් ඇතුළත් කොට අගෝස්තු 15 දිනට පෙර මෙහි දක්වා ඇති ආකෘතියට අනුව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය. |
| පළාත් | 1.පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/පළාත් දෙවන ජාතික භාෂා සම්බන්ධීකරණ නිලධාරී/පළාත් දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුව<br>2.කලාප තරගාවලියෙන් තෝරා ගත් සිසුන් | සැප්.15 | ඒ ඒ තරගයෙන් 1හා 2 ස්ථාන ලැබූ සිසුන්ගේ නම පමණක් ඇතුළත් කොට මෙහි දක්වා ඇති නිල ප්‍රතිඵල ආකෘතිය අනුව සකස් කොට සැප්. 30දිනට පෙර අධ්‍යාපන අධ්‍යක්ෂ, ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. |
| සමස්ත ලංකා මට්ටම | 1.අධ්‍යාපන අධ්‍යක්ෂ/නි.අ.අ.(දෙවන ජාතික භාෂා)<br>2.පළාත් තරගාවලියෙන් ජයග්‍රහණය ලැබූ සිසුන් | නොවැ.15 | දෙසැම්බර් 31ට පෙර ත්‍යාග හා සහතික පත් ප්‍රදානය කිරීම උත්සවාකාරයෙන් සිදු කෙරේ. |

### 3.1. පාසල් මට්ටම (මැයි 15ට පෙර)

මෙම තරගාවලියේ අරමුණු ඉටුවන පරිදි ප්‍රශස්ත අයුරින් පාසල් මට්ටමේ තරගාවලිය සඳහා 6 - 9 ශ්‍රේණිවල සියලුම සිසුන් සහභාගී කරවා ගැනීම අනිවාර්යය අවශ්‍යතාවයක් වේ. පාසල් මට්ටමේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගන්නා සිසුන්ට සහතික පත්‍ර ප්‍රදානය කිරීම සඳහා දිනයක් වෙන් කිරීම විදුහල්පති හා දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුවේ වගකීම වේ. පාසල් මට්ටමේ තරගාවලිය පවත්වා එහි ප්‍රතිඵල මත ප්‍රථම හා දෙවන ස්ථාන දිනා ගන්නා සිසුන් පමණක් කලාප මට්ටමේ තරග සඳහා සහභාගී කරවිය යුතුය. මෙහි දී මෙම චක්‍රලේඛයේ 1.3 වගන්තිය ප්‍රකාර ව ක්‍රියා කළ යුතු ය.

### 3.2. කලාප මට්ටම (ජූලි 30ට පෙර)

මෙහි දී කලාප මට්ටමින් දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුවක් පත් කර ගත යුතු ය. එහි සභාපති ලෙස කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ද, ලේකම් ලෙස විෂය සම්බන්ධීකරණ නිලධාරියා ද, කමිටු සාමාජිකයන් වශයෙන් භාෂා හා සෞන්දර්ය විෂය සම්බන්ධීකරණ නිලධාරීන් තිදෙනෙකු ඇතුළත් විය යුතු ය. කලාප මට්ටමේ ලිඛිත තරගය සඳහා අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමට පෙර වර්ෂවල දී ලබා දී ඇති ප්‍රශ්න පත්‍රය ආදර්ශයට ගනිමින් ප්‍රශ්න පත්‍රයක් සකස් කිරීම කලාපයේ දෙවන බස විෂය සම්බන්ධීකරණ නිලධාරියා විසින් කළ යුතු වේ. එමෙන්ම පාසල් මට්ටමේ තරගාවලිය අධීක්ෂණ කිරීම ද කලාප මට්ටමෙන් සිදු කළ යුතු ය. **කලාප තරගාවලිය පවත්වා එහි ප්‍රතිඵල මත ප්‍රථම හා දෙවන ස්ථාන දිනා ගන්නා සිසුන් පමණක් පළාත් මට්ටමේ තරග සඳහා සහභාගී කර ගත යුතු ය.**

3.3. පළාත් මට්ටම (සැප්තැම්බර් 15ට පෙර)

මෙම චක්‍රලේඛයේ විධිවිධාන අනුව සෑම පළාතකම දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුවක් පත් කර ගත යුතු ය. එහි සභාපති ලෙස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ද, ලේකම් ලෙස දෙවන ජාතික භාෂා සම්බන්ධීකරණ නිලධාරියා ද, කමිටු සාමාජිකයන් වශයෙන් පළාතට අදාළ කලාපවල දෙවන ජාතික භාෂා සම්බන්ධීකරණ නිලධාරින් හා ගුරු උපදේශකවරුන් ද අවම වශයෙන් එක් කලාපයකට එක් කෙනෙකු ඇතුළත් විය යුතු ය. මේ පිළිබඳව සැලසුම් කිරීම හා පාසල් මට්ටමේ සිට කලාප මට්ටමේ තරගාවලිය සඳහා උපදෙස් හා මගපෙන්වීම පළාත් දෙවන ජාතික භාෂා විෂය සම්බන්ධීකරණ නිලධාරියා විසින් කළ යුතු අතර සියලුම මට්ටමේ අධීක්ෂණ කටයුතු සඳහා ද සහභාගී විය යුතු ය.

**පළාත් මට්ටමේ වාචික තරගාවලිය පළාත් පද්‍ය ගායනා ද ඇතුළුව-** පළාත් මට්ටමේ ලිඛිත තරගය පැවැත්වීටම පෙර පවත්වා ප්‍රතිඵල නිකුත් කර තිබිය යුතුය.

පළාත් මට්ටමේ **ලිඛිත** තරග අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පළාත් වෙත ලබා දෙනු ලබන ප්‍රශ්නපත්‍ර හා කාල සටහනකට අනුව සියලුම පළාත්වල එක් දිනයක දී එකම වේලාවක දී පැවැත්විය යුතු ය.

සියලු ම පළාත් තරගවල ප්‍රතිඵල සෑම වසරක ම සැප්තැම්බර් 30ට පෙර මෘදු පිටපත්, දෘඪ පිටපත් වශයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතු ය. පළාත් තරගාවලිය පවත්වා එහි ප්‍රතිඵල මත ප්‍රථම, දෙවන ස්ථාන දිනා ගන්නා සිසුන් පමණක් සමස්ත ලංකා මට්ටමේ තරග සඳහා සහභාගි කර ගත යුතුය. පද්‍ය ගායනාවල ප්‍රථම ස්ථානය ලබා ගන්නා කණ්ඩායම පමණක් සමස්ත ලංකා මට්ටමට ඉදිරිපත් කළ යුතුය.

**සැ:යු:**

පළාත් මට්ටමේ තරග පැවැත්වීමේ දී ඒ ඒ පළාත්වලට අදාළ සියලු කලාපවල ගුරු උපදේශකවරුන් හා සම්පත්දායකයින් සහභාගී කරවා ගැනීමෙන් තරගාවලියේ විනිවිදභාවය වඩාත් හොඳින් පැහැදිලි වනු ඇත.

**3.4. සමස්ත ලංකා මට්ටම (නොවැම්බර් 30ට පෙර)**

පළාත් මට්ටමේ ප්‍රතිඵල මත චක්‍රලේඛයේ 1.3 වගන්තිය අනුව තරග ශීර්ෂ 3ක් යටතේ තෝරා ගත් සිසුන් සඳහා සමස්ත ලංකා තරගාවලිය වෙන් වෙන් වශයෙන් දෙවන ජාතික භාෂාව සිංහල හා දෙවන ජාතික භාෂාව දෙමළ වශයෙන් අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වනු ලැබේ.

**සැ:යු:**

පෙර වර්ෂවලදී ඉදිරිපත් වූ තරග ඉසව්වක දී සමස්ත ලංකා මට්ටමේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගන්නා සිසුන්ට ඉදිරි වර්ෂයන්වල දී ජයග්‍රහණය කළ තරග ඉසව්ව සඳහා සහභාගී වීමට නොහැකි වන අතර ජයග්‍රාහී තරගය හැර අනෙකුත් තරග ඉසව් සඳහා සහභාගී වීමේ අවස්ථාව ඇත. කවර මට්ටමක දී වුව ද, දී ඇති තරග නීති උල්ලංඝනය වීමක් සිදු වුවහොත් තරගයෙන් ඉවත් කිරීමට සිදු වේ.

**3.5 තරග ඉසව්**

මෙම තරගාවලියට අදාළ තරග ඉසව්, තරග පැවැත්විය යුතු ශ්‍රේණි, සහ ඉසව් සංඛ්‍යාව පහත සඳහන් වගුවෙන් දැක්වේ.

1. දෙවන ජාතික භාෂාව දෙමළ - මව්බස සිංහල වන සිසුන් සඳහා (සිංහල සිසුන්)
2. දෙවන ජාතික භාෂාව දෙමළ - මව්බස දෙමළ එහෙත් පළමු බස සිංහල වන සිසුන් සඳහා (දෙමළ හා මුස්ලිම් සිසුන්)
3. දෙවන ජාතික භාෂාව සිංහල - මව්බස දෙමළ හා පළමු බස දෙමළ වන සිසුන් සඳහා

3.6. අනන්‍යතාවය තහවුරු කිරීම :- තැපැල් හැඳුනුම්පත හෝ විදුහල්පති නිර්දේශ සහිත ඡායාරූපයක් හා උප්පැන්න සහතිකයේ මුල් පිටපතක් / සහතික කළ පිටපතක් ඉදිරිපත් කළ යුතුය.

| අනු අංකය | ඇගයීම් වර්ගය | ශ්‍රේණිය හා තරග සංඛ්‍යාව | | | | මුළු තරග |
|---|---|---|---|---|---|---|
| | | 06 ශ්‍රේණිය | 07 ශ්‍රේණිය | 08 ශ්‍රේණිය | 09 ශ්‍රේණිය | |
| 01 | භාෂා භාවිතය හා අවබෝධය | 03 | 03 | 03 | 03 | **12** |
| 02 | කියවීම | 03 | 03 | 03 | 03 | **12** |
| 03 | කථික | 03 | 03 | 03 | 03 | **12** |
| | මුළු තරග ගණන | 09 | 09 | 09 | 09 | **36** |
| 04 | පද්‍ය ගායනා කණ්ඩායම් තරග | | | | | **03** |
| | **මුළු තරග ගණන** | | | | | **39** |

සෑම තරගයක්ම ආරම්භයට පෙර මෙහි පහත සඳහන් අභිමතාර්ථ, කොන්දේසි හා ලකුණු ක්‍රමය සිසුන්ට පැහැදිලි කර දීම අදාළ නිලධාරීන්ගේ වගකීම වේ. තරග සඳහා ඉදිරිපත් වීමේ දී නිවැරදි නම, ලිපිනය, ශ්‍රේණිය, ඉගෙන ගන්නා මාධ්‍ය තරගයට ඉදිරිපත් වන කලාපය හා පළාත අනිවාර්යයෙන් සඳහන් කළ යුතු ය. (මෙම විස්තර තමන්ගේ මව්බසින් ලිවිය හැකි ය.)

**මෙම තරගාවලියේ දී විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ.**

**4.0. කොන්දේසි හා ලකුණු ක්‍රමය**

**4.1. භාෂා භාවිතය හා අවබෝධය - ලිඛිත තරගය**

**4.1.1. අභිමතාර්ථ**

අකුරු, වචන, වාක්‍ය, හා පින්තූර නිවැරදි ව හඳුනා ගැනීමේ කුසලතා වර්ධනය හා දෙවන ජාතික භාෂාව පිළිබඳව අවබෝධය වැඩි දියුණු කිරීම.

**4.1.2. තරග ක්‍රියා පටිපාටිය**

1) 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා තරග 4කි.

2) 6, 7 ශ්‍රේණි සඳහා පැය 1යි විනාඩි 30ක් හා 8, 9 ශ්‍රේණි සඳහා පැය 2ක් වන සේ කාලය වෙන් කළ යුතු වේ.

3) එක් එක් ශ්‍රේණියට අදාළ පෙළපොත්වලින් ප්‍රශ්න සකස් කෙරේ. ඊට අමතරව එදිනෙදා ජීවිතයට අදාළ සාමාන්‍ය දැනුම පරීක්ෂා කරන ප්‍රශ්න ද ඇතුළත් කෙරේ.

4) පළාත් හා සමස්ත ලංකා මට්ටම සඳහා ප්‍රශ්න පත්‍ර අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සකස් කෙරේ.

**4.1.3. ලකුණු ක්‍රමය**

මුළු ලකුණු 100කි.

**4.2. කියවීම**

**4.2.1. අභිමතාර්ථ**

1) නිවැරදි උච්චාරණය හුරු කිරීම.

2) අවබෝධයෙන් හා අවධානයෙන් යුතු ව කියවීම.

3) කියවීමේ හැකියාව හා වේගය වර්ධනය කිරීම.

4) ශබ්ද නගා කියවීම හුරු කිරීම.

5) හැඟීම් ප්‍රකාශ වන සේ කියවීම වැඩි දියුණු කිරීම.

**4.2.2. තරග ක්‍රියා පටිපාටිය**

1) 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා ඉසව් 4කි.

2) ශ්‍රේණියට අදාළ පෙළපොතින් එක් කොටසක් සහ විනිශ්චය මණ්ඩලය විසින් දෙනු ලබන පුවත්පත් , සඟරා හෝ වෙනත් පොත් ආදියෙන් තවත් එක් කොටසක් ද ශබ්ද නගා කියවීම.

3) හඬ පාලනය, විරාම ලක්ෂණ හා පද බෙදීම ආදිය ගැන සැලකිලිමත් වීම.

**4.2.3. ලකුණු දීමේ ක්‍රමය**

| | |
|---|---|
| 1) අවබෝධයෙන් කියවීම | - 15 |
| 2) නිවැරදි උච්චාරණය | - 10 |
| 3) පැහැදිලි ව ශබ්ද නගා කියවීම | - 10 |
| 4) හැඟීම් ප්‍රකාශ වන සේ කියවීම | - 10 |
| 5) සමස්ත කියවීම | - 05 |
| **මුළු ලකුණු** | **- 50** |

**4.3. කථික**

**4.3.1. අභිමතාර්ථ**

1) කථන හැකියාව වැඩි දියුණු කිරීම.

2) තර්කානුකූලව හා ක්‍රමානුකූලව අදහස් ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම.

3) මාතෘකාවට අදාළ කරුණු නියමිත කාලයන් තුළ ඉදිරිපත් කිරීමේ හැකියාව වර්ධනය කිරීම.

4) පැහැදිලි උච්චාරණය දියුණු කිරීම.

5) හඬ පාලනය හා උචිත අංග චලන තුළින් සභාව ආකර්ෂණය කර ගැනීමේ හැකියාව වර්ධනය කිරීම.

**4.3.2. ඇගයීම් ක්‍රියා පටිපාටිය**

1) 6, 7, 8, 9 ශ්‍රේණි සඳහා ඇගයීම් 4කි.

2) ඇමුණුම් අංක 1හි සඳහන් මාතෘකා අතුරින් කුසපත් ඇදීමෙන් ලැබෙන මාතෘකාව යටතේ පමණක් කථා කළ යුතු අතර මාතෘකාව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. (මාතෘකා වාර්ෂික ව වෙනස් කරනු ලැබේ.) කාලය විනාඩි 03කි.

3) ඊට අමතරව පළාත් හා සමස්ත ලංකා මට්ටමේ දී විනිශ්චය මණ්ඩලය විසින් එම අවස්ථාවේ දී ලබා දෙනු ලබන සරල මාතෘකාවක් ඔස්සේ කථාවක් ඉදිරිපත් කළ යුතු ය. කාලය විනාඩි 02කි. සූදානම් වීම සඳහා විනාඩි 02ක් ලබා දිය යුතුය.

#### 4.3.3. ලකුණු දීමේ ක්‍රමය

| | |
|---|---|
| 1) මාතෘකාවට අදාළ වීම හා නිර්මාණශීලී බව | - 15 |
| 2) පැහැදිලි හා නිවැරදි උච්චාරණය | - 10 |
| 3) කරුණු පැහැදිලිව ඉදිරිපත් කිරීමේ හැකියාව | - 10 |
| 4) හඬ පාලනය හා උචිත අංග චලනය | - 10 |
| 5) නියමිත කාලය ප්‍රයෝජනයට ගැනීම හා අවසානය | - 05 |
| **මුළු ලකුණු** | **- 50** |

### 4.4. පද්‍ය ගායනා

#### 4.4.1. අභිමතාර්ථ

1) රිද්මයානුකූලව ද, තාලානුකූලව ද, ගැයීමේ හැකියාව, නිවැරදිව උච්චාරණය, හැඟීම් දැනවීමේ ශක්තිය හා සම්ප්‍රදායානුකූල ගායන ශෛලිය හඳුනා ගැනීම.

2) සංස්කෘතික අනන්‍යතාව හඳුනා ගැනීම හා හුවමාරු කර ගැනීම.

#### 4.4.2. ඇගයීම් ක්‍රියා පටිපාටිය

1) මෙම තරගය ද ඉහත කී (3.5) ශීර්ෂ යටතේ පැවැත් වේ.

2) එක් පාසලකින් 6, 7, 8, 9 ශ්‍රේණිවලින් එක් ශ්‍රේණියකින් සිසුන් දෙදෙනා බැගින් ඇතුළත් වන පරිදි සිසුන් 8 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම සහභාගී කළ යුතුය. පාසල්, කලාප, හා පළාත් මට්ටම්වලින් ප්‍රථම ස්ථානය ලබා ගත් කණ්ඩායම පමණක් සමස්ත ලංකා තරගවලට ද ඉදිරිපත් කළ යුතු ය. (කණ්ඩායමේ සාමාජිකයන් කිසිම හේතුවක් මත වෙනස් කළ නොහැක.)

3) වාද්‍ය භාණ්ඩ භාවිතා නොකළ යුතු ය.

4) චක්‍රලේඛයේ ඇමුණුම් අංක IIහි දක්වා ඇති ජන ගායනා අතුරින් තෝරා ගත් කොටස් දෙකකට අදාළ කවි ද, ඊට අමතරව ඔබ විසින් තෝරා ගන්නා ලද ජන කවි වර්ගයකින් එක් කවියක් ද වශයෙන් කවි 03ක් තරගය සඳහා ඉදිරිපත් කළ යුතු ය. ඔබ විසින් තෝරා ගන්නා කවිය අදාළ වර්ෂයේ ඇමුණුම IIහි නොමැති කවියක් විය යුතු ය. පහත සඳහන් මාතෘකා ඔස්සේ තරගාවලියට අදාළ ව වාර්ෂික ව සුදුසු පද්‍ය කාණ්ඩ තෝරා නිර්දේශ කිරීම අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාවේ අධ්‍යක්ෂකගේ වගකීම වනු ඇත.

I. උපදේශාත්මක කවි
II. දේශාභිමානී කවි
III. දරු නැලවිලි ගී
IV. කෙළි ගී
V. රැකියා ආශ්‍රිත ගී

චක්‍රලේඛයේ ඇමුණුම් අංක II හි මෙම කොටස්වලට අදාළ ජන ගී දක්වා ඇත.

5) පද්‍ය කටපාඩමින් ගායනා කළ යුතු ය.

6) ඒ ඒ පද්‍යයට අයත් විරිත හඳුනා ගෙන ගායනා කළ යුතු ය.

7) මුහුණේ ඉරියව් හැර අංග චලනය විනිශ්චයේ දී සලකා නොබලන බැවින් අංග චලනය අවශ්‍ය නැත.

8) පාසල් නිල ඇඳුමින් සැරසී ගායනා කළ යුතු ය.

### 4.5.3. ලකුණු දීමේ ක්‍රමය

| | |
|---|---|
| 1) සම්ප්‍රදායානුකූල නාද රටා - ශ්‍රැති අනුගමනය කිරීම | - 15 |
| 2) වචනවල නිවැරදි උච්චාරණය | - 15 |
| 3) කණ්ඩායම් හැගීමෙන් යුතුව ගායනා කිරීම | - 10 |
| 4) මුහුණේ ඉරියව් හැඟීම් දැනවීම හා මතකය | - 10 |
| **මුළු ලකුණු** | **- 50** |

### 5.0. තරග සංවිධාන කටයුතු සඳහා පොදු උපදෙස්

5.1. සෑම පාසලක ම දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටුවක් පත් කර ගත යුතුය. එහි සභාපති ලෙස විදුහල්පති ද ලේකම් ලෙස විෂයභාර ගුරුවරයා ද කමිටු සාමාජිකයන් වශයෙන් සිංහල දෙමළ හා සෞන්දර්ය ගුරුවරු තිදෙනෙකු ද ඇතුළත් විය යුතු ය.

5.2. පාසල් මට්ටම් තරග 6 – 9 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් සහභාගී කරවා ගෙන පැවැත්විය යුතු ය. මේ සම්බන්ධයෙන් විදුහල්පතිවරුන්, විෂයභාර ගුරුවරුන් හා දෙවන ජාතික භාෂා සංවර්ධන කමිටු වගකීම දැරිය යුතු වේ.

5.3. තරගාවලිය සඳහා සහභාගිවන්නන් (එක් තරගයකට) - පද්‍ය ගායනා හැර

5.3.1. පාසල් මට්ටම - 6- 9 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සියලුම සිසුන්

5.3.2. කලාප මට්ටම - පාසල් මට්ටමින් ප්‍රථම හා දෙවන ස්ථාන ජයග්‍රහණය ලැබූ සිසුන් (උපරිම දෙදෙනෙක්)

5.3.3. පළාත් මට්ටම - කලාපවලින් ප්‍රථම හා දෙවන ස්ථාන ජයග්‍රහණය ලැබූ සිසුන් (උපරිම දෙදෙනෙක්)

5.3.4. සමස්ත ලංකා - පළාත්වලින් ප්‍රථම හා දෙවන ස්ථාන ජයග්‍රහණය ලැබූ සිසුන් (උපරිම දෙදෙනෙක්)

5.4. පාසල්, කලාප, පළාත් හා සමස්ත ලංකා මට්ටමේ ප්‍රථම, දෙවන හා තෙවන ස්ථාන ලබා ගත් සිසුන්ට ඒ ඒ මට්ටමේ දී සහතික පත්‍ර ප්‍රදානය කිරීම සිදු කළ යුතු ය. එය ප්‍රමාද කිරීම තුළින් තරගාවලියේ අරමුණු ඉටු වීම සිදු නොවනු ඇත.

5.5. මෙම තරගාවලිය පැවැත්වීමේ දී සියලු ම මට්ටම්වල නිලධාරීන් විසින් විධිමත්ව හා අපක්ෂපාතීව කටයුතු කිරීමටත් නිසි පරිදි දින වකවානු අනුව තරග පවත්වා නිල ප්‍රතිඵල වඩාත් නිවැරදි සහ ප්‍රමාදයකින් තොරව විනිවිදභාවයකින් යුතුව නිකුත් කිරීම සහ ඊට අදාළ සිසු තොරතුරු ගොනු කර තබා ගැනීම එක් එක් බලධාරීන්ගේ වගකීම වේ.

5.6. මූලික වටයේ සහභාගී වන තරගකරුවන් වෙනුවට ඊළඟ මට්ටම්වල දී ආදේශ තරගකරුවන් ඉදිරිපත් කළ නොහැකිය.

5.7. තරගකරුවන්ගේ සම්පූර්ණ නම, උප්පැන්න සහතිකය හා සසඳා නිවැරදි බවට තහවුරු කර ගත යුතුය.

5.8. උප්පැන්න සහතිකයට අනුව ජන වර්ගය හඳුනා ගැනීමෙන් ඉදිරිපත් වන තරග ශීර්ෂය පැහැදිලිව හඳුනා ගත හැකි වනු ඇත.

ඇමුණුම I

## ආදර්ශ ආකෘති පත්‍රය

දෙවන ජාතික භාෂා (සිංහල/දෙමළ) තරගාවලිය (අනවශ්‍ය වචනය කපා දමන්න.)

01. සිසුවාගේ සම්පූර්ණ නම :-.................................................................................
02. මුලකුරු සමග නම :-.......................................................................................
03. පාසලේ නම සහ ලිපිනය :-.................................................................................
04. ශිෂ්‍යයාගේ පෞද්ගලික දුරකථන අංකය :-......................................................
05. ඉගෙනුම ලබන මාධ්‍යය:-.................................................................................
06. ඉගෙනුම ලබන පළමු භාෂාව:-...........................................................................
07. තරගයට ඉදිරිපත් වන දෙවන ජාතික භාෂාව:-.....................................................
08. ඉදිරිපත් වන තරගය:-......................................................................................
09. කලාපය :-.....................................................................................................
10. පළාත:-.........................................................................................................
11. ශ්‍රේණිය (උදා.6 ශ්‍රේණිය) :-................................................................................
12. මෙම වර්ෂයට පෙර වර්ෂයක දී දෙවන ජාතික භාෂාව (සිංහල/දෙමළ) සමස්ත ලංකා තරගයකට ඉදිරිපත් වී ප්‍රථම/ දෙවන/ තෙවන ස්ථාන ලබා ගත්තේ නම් එය සඳහන් කරන්න. (ඔවුන්ට සමස්ත ලංකා තරගයට එම තරග වර්ගයෙන් ඉදිරිපත් වීමේ හැකියාව නැත.)

I. වර්ෂය - ශ්‍රේණිය -

II. තරග වර්ග ☐ කථික ☐ කියවීම ☐ භාෂා භාවිතය හා අවබෝධය ☐ පද්‍ය ගායනා

III. තරග ශීර්ෂය (1.3ට අදාළව) :-.............................................................................
(ශීර්ෂයට අදාළ අංකය ලියන්න.)

IV. ලබා ගත් ස්ථානය:-

ප්‍රථම ☐ දෙවන ☐ තෙවන ☐

**ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට තහවුරු කරමු**

1) විෂය භාර ගුරු භවතාගේ නම:-..........................අත්සන:-.........................දිනය:-.........................
2) විදුහල්පති අත්සන:-.................................. නිල මුද්‍රාව/දිනය:-...................................
3) විෂය සම්බන්ධීකරණ නිලධාරි අත්සන:-..................... දිනය:-...................................
4) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන:-...................... නිලමුද්‍රාව/දිනය:-...................................
5) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අත්සන:-...................... නිලමුද්‍රාව/දිනය:-...................................

(මෙම ප්‍රතිඵල වාර්තා කළ යුතු නිල ආකෘති පත්‍රය නිවැරදි ව සම්පූර්ණ කොට ඊළඟ තරග සඳහා පිටපත් දෙකකින් සකස් කර ඉදිරිපත් කළ යුතු වේ.)